කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 අගෝස්තු

සමාජීය විද්‍යා පීඨය

සමාජවිද්‍යාව

සමාජ විද්‍යාත්මක න්‍යාය - **SOCI 28214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු ලියන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. සමාජ විද්‍යා න්‍යායෙහි මූලික ප්‍රභේදයන් හඳුන්වා න්‍යායක දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ මොනවාදැයි විස්තර කරන්න.

02. ඔගස්ට් කොම්ට් ඉදිරිපත් කළ සමාජ ස්ථිතිකත්වය සහ සමාජ ගතිකත්වය යන සංකල්ප පැහැදිලි කර සමාජය අධ්‍යයනය කිරීමේ දී යථානුභූතවාදී දර්ශනය වැදගත්වන ආකාරය විමර්ශනය කරන්න.

03. එමිල් දුර්කයිම් විසින් හඳුන්වා දුන් 'සමාජ කරුණු' පිළිබඳ සංකල්පය විස්තර කර, සියදිවි නසාගැනීම කෙරෙහි සමාජ කරුණු බලපාන ආකාරය ඔහුගේ 'සියදිවි නසාගැනීම' නමැති අධ්‍යයනය ආශ්‍රිතව සාකච්ඡා කරන්න.

04. කාල් මාක්ස් විසින් ඉදිරිපත් කළ අපෝහකවාදයේ මූලික රීතීන් පෙන්වා දී සමාජ ඉතිහාසය පන්ති ගැටුමෙහි ප්‍රතිඵලයක් වන ආකාරය ඓතිහාසික භෞතිකවාදය ඇසුරින් විවේචනාත්මක විග්‍රහයක් කරන්න.

05. සමාජ ස්ථරායනය පිළිබඳ කාල් මාක්ස් සහ මැක්ස් වෙබර් දැක්වූ අදහස් පිළිබඳ තුලනාත්මක විග්‍රහයක යෙදෙන්න.

06. සමාජ විද්‍යාවේ කෘත්‍යවාදය ගොඩනැඟීමට ටැල්කොට් පාසන්ස්ගෙන් ලැබුණ දායකත්වය අගය කරන්න.

07. මානව අන්තර් සබඳතාවන්හි දී 'සංකේත' වැදගත් වන ආකාරය අර්වින් ගොෆ්මාන්ගේ ඉගැන්වීම් ආශ්‍රිතව විස්තර කරන්න.

08. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳ සමාජ විද්‍යාත්මක සටහන් ලියන්න.

    i. න්‍යායේ කාර්යභාරය
    ii. රැල්ෆ් ඩැරෙන්ඩෝෆ්
    iii. ආගම පිළිබඳ සමාජ විද්‍යාත්මක ඉගැන්වීම්
    iv. ජී.එච්. මීඩ්
    v. හර්බට් ස්පෙන්සර් සහ පරිණාමවාදය

*******************************